# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1599 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 20/12/2023<br>පැය 1550 | | |

## මාධ්‍ය නිවේදනය

**01. බලපත්‍ර නොමැතිව පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.12.19 වන දින දහවල් කාලයේ දී මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව මන්නාරම පොලිස් වසමේ සින්නකඩේ ප්‍රදේශයේදී වැටලීමක් **සිදුකර ජෙලට් නයිට් කූරු 525ක්, ඩෙටනේටර් 354 ක් සහ අඩි 318 ක් දිග සේවා නූල් 10 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන සින්නකඩේ, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2023.12.19 වන දින දහවල් කාලයේදී පැලියගොඩ පොලිස් වසමේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැටලීම් 03 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 18 මිලිග්‍රෑම් 770 ක්** සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35, 42 හා 45 වයස්වල පසුවන පිළිවෙලින් පැලියගොඩ, කොළඹ 14 හා උස්වැටකෙයියාව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.

2023.12.19 වන දින උදෑසන කාලයේ දී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හෝමාගම පොලිස් වසමේ පිංකෙත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන ගලවිල පාර, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

හෝමාගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අම්පාර කොට්ඨාස දූෂණ මර්ධන අංශය.

2023.12.19 වන දින සවස් කාලයේ දී අම්පාර කොට්ඨාස දූෂණ මර්ධන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නින්දවූර් පොලිස් වසමේ කෝවිල් පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 54** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නින්දවූර් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන නින්දවූර් 07 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

නින්දවූර් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. බඹර ප්‍රහාරයකින් කාන්තාවක් හා පුද්ගලයෙකු රෝහල්ගත කිරීමක් - ගිනිගත්හේන පොලිස් වසම.

2023.12.19 වන දින දහවල් කාලයේ ගිනිගත්හේන පොලිස් වසමේ කෙනිල්වත්ත කැලෑබඳ ප්‍රදේශයේ දර සෙවීමට පිටව ගොස් සිටියදී, කාන්තාවක් හා පුද්ගලයෙකු බඹර ප්‍රහාරයකට ලක්ව ගිනිගත්හේන රෝහලට ඇතුලත් කර ඇති බවට ගිනිගත්හේන පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**බඹර ප්‍රහාරයට ලක් වූ පුද්ගලයා වයස අවුරුදු 53 ක් හා කාන්තාව වයස අවුරුදු 54 ක් වන කෙනිල්වත්ත, ගිනිගත්හේන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තුවාලකරු හා තුවාලකාරිය වැඩිදුර ප්‍රතිකාර සඳහා නාවලපිටිය රෝහල වෙත මාරුකර යවා ඇත. ගිනිගත්හේන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාමක් - කිලිනොච්චිය පොලිස් වසම.

2023.12.19 වන දින සවස් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ ආනන්ද පුරම් ප්‍රදේශයේ දුම්රිය හරස් මාර්ගයෙන් ගමන් කළ යතුරු පැදියක් අනුරාධපුරය සිට කන්කසන්තුරය බලා ධාවනයවූ දුම්රියේ ගැටී පුද්ගලයෙකු තුවාල ලබා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට කිලිනොච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වන ක්‍රිෂ්නපුරම්, කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිලිනොච්චිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**